2023

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report



විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

விஜய குமாரதுங்க ஞாபகார்த்த வைத்தியசாலை

Wijaya Kumaratunga Memorial Hospital

වාර්ෂික වාර්තාව- සිංහල

2023

පටුන

අන්තර්ගතය	පිටු අංකය
විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම	03-04
ආයතනික තොරතුරු	05-06
ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිනියගේ ලිපිය	07
කාර්ය මණ්ඩල වාර්තාව	08
රෝහල් සේවා විශ්ලේෂණය	09-16
2023 වසරේ හා සපුරාගත් ඉලක්ක හා ප්‍රධාන සිදුවීම්	17
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ඇතුලු මූල්‍ය ප්‍රකාශ	19-32
2023 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව (2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව)	33-38

දැක්ම

අනාගතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම.

මෙහෙවර

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. කායික රෝග, ශල්‍ය රෝග , අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම

සාමූහික අභිමතාර්ථයන්

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2023 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා

ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදුව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදුව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදුවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකක් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදුවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල පනත ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ මෙන්ම සායන වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අඩු ආදායම්ලාභී ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම 2004 දී දියත් කර ඇත. ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලද අතර 2007 දී සමස්ථ ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් විය.

2012 වසරේ දී දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය වර්තමානයේ සාමාන්‍ය ගඩබා, රාජකාරී කාමර විවේක කාමර හා දේශන ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

2015 වසරේ දී ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන් කර ගැනීමට හැකි වී ඇති අතර එය රසායනාගාර ගොඩනැගිල්ල ලෙස නම් කර ඇත. වර්තමානයේ එතුල රසායනාගාරය, වෛද්‍ය ලේඛණාගාරය, අභ්‍යන්තර විගණන ඒකකය , ඖෂධ ගබඩාව , උපයෝගීතා කාමර ස්ථාපිත කර ඇත.

2016 වසර තුල ශල්‍ය ඒකකය පිහිටුවනු ලැබූ අතර ශල්‍ය වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් ශල්‍ය ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි

2017 දී ශල්‍ය වාට්ටුව අක්ෂි ගොඩනැගිල්ලට වෙත මාරු කරන ලද අතර 2017 නොවැම්බර් මාසයේදී බාහිර රසායනාගාරය නව රසායනාගාර ගොඩනැගිල්ල තුල ස්ථාපිත කෙරිනි.යෝජිත වාට්ටු සංකීර්ණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම 2017 අග භාගයේ දී විශ්ලේෂණය කෙරිණ.

2019 වසරේදී යෝජිත වාට්ටු සංකීර්ණය ඉදි කිරීම සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී.නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ඉහත යෝජිත වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවිනි.

ප්‍රධාන ව්‍යාපෘති වශයෙන් වසර කීපයක සිට අවශ්‍යතාවයක්ව පැවති ශල්‍යාගාර අලුත්වැඩියාව සහ වෛද්‍යවරුන්ගේ විවේකාගාරයක් ඉදි කිරීම 2019 වසරේදී සිදු කර ගැනීමට හැකිවිනි.

ප්‍රධාන ව්‍යාපෘති ලෙස අක්ෂි ගොඩනැගිල්ලට අයත් අක්ෂි හා ශල්‍ය වාට්ටු , අක්ෂි සායන නවීකරණ කටයුතු 2020 වසරේදී සිදු කර ඇත.

2020 හා 2021 දී වසරේදී ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල් සේවාවට බාධා ඇති වුවද , ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

පවුල් වෛද්‍ය සායනය අලුත්වැඩියා කිරීම 2021 වසරේදී සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘතියකි. පැවති ඒක්ස් රේ යන්ත්‍රය වසර 21 ක් පැරණි බැවින් ජීව විද්‍යා ඉංජිනේරු අංශයෙන් පරිත්‍යාග ලෙස නව යන්ත්‍රයක් ලබා ගැනීමට එවකට සිටි අධ්‍යක්ෂ වෛද්‍ය රෝයි පෙරේරා මහතා සමත් විනි. 2021 වසරේදී රුපියල් මිලියන 19.32 ක් වටිනා නවීන ඔපරේටින් මයික්‍රොස්කොප් යන්ත්‍රයක් අක්ෂි ශල්‍යාගාරය වෙත ලබා ගැනීමට හැකි විනි.

2022 වසරේ පවුල් වෛද්‍ය සායනය ඖෂධ ගබඩාවේ ස්ථාපිත කර ඖෂධ ගබඩාව නව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහල තුල ස්ථාපිත කරන ලදී.

2022 වසරේදී සායන සඳහා නව අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිනි. රට තුල පැවති ආර්ථික තත්වය මත ශල්‍යකර්ම ගාස්තු ද සංශෝධනය කරන ලදී. IOL ශල්‍යකර්ම සඳහා වූ කාව රෝහලෙන් නොසැපයීම මත රජයේ මුදල් ඉතිරි කරගෙන ඇත.

රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත වියදම් අධික ශල්‍යකර්මයන් 02 ක් වන TPPV සහ Silicon Oil Removal යන ශල්‍යකර්ම වල ගාස්තු සංශෝධනයක් සිදු කර ඇත.

එසෙම අක්ෂි සායනයේ, ශල්‍ය සායනයේ සහ තුවාල සත්කාර ඒක්කයේ සහ පැමිණෙන රෝගීන්ගේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයේ සංශෝධනයක්ද සිදු කරන ලදී.

වර්තමානයේ වාට්ටු 5 ක් සහ ඇඳන් 137 ක් ඇත . (2023)

ආයතනික තොරතුරු
01-01-2023 ~ 31-12-2023

ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදුව

කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

විගනකවරු

- විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, 306 /72 , පොල්දූව පාර , බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය,
  අංක 26, ශ්‍රී සංඝරාජ මාවත , කොළඹ 10
-

අධ්‍යක්ෂ මණ්ඩලය

01-01-2023 ~ 31-12-2023

සභාපතිනි

- හිටපු ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

අධ්‍යක්ෂ මණ්ඩලය

- වෛද්‍ය අසේල ගුණවර්ධන, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය
- එන්.ඒ. උමගිලිය මයා
- වයි.සුමනා යාපා මෙය- භාණ්ඩාගාර නියෝජිත
- ආනන්ද විමලසේන මයා
- විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය චරිත් ෆොන්සේකා මයා
- විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය චාමර කුමාරගේ මයා

විගණන කමිටුව

01-01-2023 ~ 31-12-2023

සභාපති

වයි.සුමනා යාපා මෙය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

නිරීක්ෂක

ආර්.එම්.එස්.වසන්තා මිය , ප්‍රධාන අභ්‍යන්තර විගණක , සෞඛ්‍ය අමාත්‍යාංශය,
ඒ.කේ.ඩී.ඉනෝකා මිය , විගණන අධිකාරි , ජාතික විගණන කාර්යාලය , බත්තරමුල්ල

සාමාජික

වෛද්‍ය ඩී.ජී.ඒ.රණවීර මයා, ප්‍රධාන වෛද්‍ය නිලධාරී, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

<u>සහභාගිත්වය</u>
පී. ඒ. එම්. පී. එන්. පෙරේරා මිය, අභ්‍යන්තර විගණක, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
පී.ඩී.ටී.පී.එන්.බර්නාඩ් මිය, ගණකාධිකාරී, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
ආර්. ඒ ඒ එස් කේ රණසිංහ මයා, පරිපාලන නිලධාරී , විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදුව

සභාපතිවරිය විසින් වාර්ෂික වාර්තාව යොමු කිරීමේ ලිපිය

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

2023 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2023 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග
සභාපතිනී,
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සීදුව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2023-12-31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ	1	0
නිර් වින්දන විශේෂඥ වෛද්‍ය	1	1-දවිතියික පදනම මත
කායික රෝග විශේෂඥ වෛද්‍ය	2	1
පවුල් වෛද්‍ය විශේෂඥ	1	0
ශල්‍ය වෛද්‍ය විශේෂඥ	1	1
අන්තරාසර්ග විශේෂඥ වෛද්‍ය	1	0
අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය	2	2
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	1	1
වෛද්‍ය නිලධාරී	28	15
දන්ත ශල්‍ය වෛද්‍ය	2	0
අභ්‍යන්තර විගණක	1	0
ගණකාධිකාරී	1	1
ලියාපදිංචි වෛද්‍ය නිලධාරී	2	2
විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී	1	0
හෙද සොයුරිය	3	2
හෙද නිලධාරී	85	84
පරිපාලන නිලධාරී	1	1
ඖෂධවේදී	6	6
විකිරණශිල්පී	2	1
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ	5	3
අක්ෂි තාක්ෂණවේදී	4	3
පෝෂණවේදී	1	0
වැඩ මූලික	1	0
වායු සමීකරණ කාර්මික ශිල්පී	1	0
විද්‍යුත් බන්තු රේඛණ ශිල්පී	2	1
කලමණාකරණ සහකාර	11	10
ඖෂධ සංයෝජක	3	2
ආහාර නිරීක්ෂිකා	1	1
නිවාස භාරකාරිනී	1	0
වෛද්‍ය ලේඛණාගාර සහකාර	1	0
වාට්ටු ලිපිකරු	1	0
රියදුරු	5	4
විදුලි කාර්මික	1	1
නඩත්තු කම්කරු	3	2
ලැබ් ඕඩර්ලි	2	2
අරක්කැමි	3	2
දූකරථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී	3	1
සෞඛ්‍ය කාර්ය සහයක	69	63
එකතුව	**260**	**213**

ප්‍රධාන වෛද්‍ය නිලධාරී රෝහල් අධ්‍යක්ෂක තනතුරේ රාජකාරී ආවරණය කරන අතර හෙද සොහොයුරිය විසින් විශේෂ ශ්‍රේණියේ හෙද නිලාදරිනී තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලබයි.

රෝහල මගින් ලබා දෙන සේවා

හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ. බාහිර රෝගී අංශය (OPD), ප්‍රාථමික සත්කාර ඒකකය (PCU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සලසා දේ. කායික වෛද්‍ය වාට්ටු, ශල්‍ය වාට්ටු, අක්ෂි වාට්ටු, තුවාල සත්කාරක වාට්ටුව හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සලසා දේ.

2023 වසරේ වාට්ටුගතව ප්‍රතිකාර ලබා ගත් ප්‍රතිශතය 83.20% ක් විය.

2023 වසරේදී මුලු රෝගී වාට්ටුගත ඇතුලත්වීම් 15397 ක් විය.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි ඩිස්පෙන්සරිය, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. මෙම රෝහල ඒ වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වසරේදී වර්ග කර ඇත.

අභ්‍යන්තර කළමණාකරනය අවශ්‍ය වන වෛද්‍ය, ශල්‍ය හා අක්ෂිමය සංකූලතා වලින් පෙලෙන රෝගීන් බාහිර රෝගී අංශය, ප්‍රාථමික සත්කාර ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ. MRI, CT ස්කෑන් වැනි විශේෂ පරීක්ෂණ අවශ්‍යවන රෝගීන්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල වැනි රෝහල් වලට යොමු කෙරේ.

2022 දී රෝහල් ගාස්තු වැඩි කිරීමත් , කාචය රෝගීයා විසින්ම මිලදී ගැනීමට ගත් තීරණයත් නිසා රජයට දැරිය යුතු මූල්‍ය බර අඩු කර ගැනීමට හැකි විනි.

රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත වියදම් අධික ශල්‍යකර්මයන් 02 ක් වන TPPV සහ Silicon Oil Removal/ Insertion යන ශල්‍යකර්ම වල ගාස්තු සංශෝධනායක් සිදු කර ඇත.

1. <u>බාහිර රෝගී අංශය (OPD)</u>

රෝහලේ බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ සීදුව කොටුගොඩ,රද්දොළුව, කඳාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර සඳහා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර දිනපතා උදේ 8 සිට සවස 4 දක්වා බාහිර රෝගී අංශය ක්‍රියාත්මක වේ.එම නිවාඩු දින වල බාහිර රෝගී අංශය පෙ.ව. 8 සිට 10.30 දක්වා ක්‍රියාත්මක වේ.බාහිර රෝගී අංශ රෝගීන්ට සියලුම ඖෂධ වර්ග රෝහල් ඩිස්පැන්සරියෙන් ලබා දේ.බාහිර රෝගී අංශයේ රෝගීන් සඳහා ඊ.සී.ජී හා ඒක්ස් රේ පහසුකම් සලසා ඇත.

අවශ්‍ය අවස්ථා වල බාහිර අංශ රෝගීන් වෛද්‍ය සායනයට , අන්තරාසර්ග රෝග සායනයට හා ශ්වසන රෝගී සායනය වෙත යොමු කෙරේ.

2023 වසර තුල බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව **113317** කි.

බාහිර රෝගී අංශය මගින් සැරහුම් යෙදීම් **2824** ක් හා එන්නත් ලබා දීම් **871** ක් ද සිදු කර ඇත.

1 වගුව මගින් බාහිර රෝගී අංශයට සම්බන්ධ පසුගිය වසර 5 තුල තත්වය විදහා දැක්වේ.

2. <u>ප්‍රාථමික සත්කාර ඒකකය (PCU)</u>

පැය විසිහතර පුරා විවෘතව ඇති ප්‍රාථමික සත්කාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු , පිහි ඇණුම් හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. උග්‍ර හදිසි අවස්ථා ප්‍රාථමික සත්කාර ඒකකයේ කලමණාකරණය කරනු ලබන අතර වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි වැඩිදුර කලමණාකරණය අවශ්‍ය රෝගීන් රෝහලේ අදාල වාට්ටු වලට ඇතුලත් කර ඇත. සිදු කරනු ලබන ප්‍රතිකාර වලට අමතරව විශේෂිත වෛද්‍ය සත්කාර අවශ්‍ය වන රෝගීන් විශේෂිත ප්‍රතිකාර සඳහා මීගමුව රෝහල , උතුරු කොළඹ ශික්ෂණ රෝහල ,ජාතික අක්ෂි රෝහල යන රෝහල් වෙත වෙතට මාරු කෙරේ.

ප්‍රාථමික සත්කාර ඒකකයෙන් 2023 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව 18196 ක් විය.ගත වූ වසර 5 ට අදාළව ප්‍රාථමික සත්කාර ඒකකයේ සංඛ්‍යා ලේඛන 1 වගුව තුල දක්වා ඇත

3. <u>දන්ත ඒකකය</u>

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ. ජේෂ්ඨ පුරවැසියන් සඳහා සතියේ සෑම දිනකම ද , පාසැල් සිසුන් සඳහා සෙනසුරාදා දිනවල ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් ,දත් සුද්ද කිරීම , ළමා දන්ත ප්‍රතිකාර, සුළු සැත්කම් ප්‍රතිකාර සායනය තුලදී සිදු කෙරේ. මියුකොසිල් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ මාර්ග අනතුරු වලින් සිදු වූ දන්ත අබාධ ප්‍රතිකාර යන ප්‍රතිකාර සිදු කරන සුළු සැත්කම් අතර කිහිපයකි.

2023 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව **4,032** ක් විය**.** ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත**.**

4. <u>කායික වෛද්‍ය ඒකකය</u>

කායික වෛද්‍ය ඒකකය වාට්ටු 2 කින් හා වෛද්‍ය සායනයකින් සමන්විත වේ. පිරිමි වාට්ටුවෙහි ඇඳන් 20 ක් ද ගැහැණු වාට්ටුවෙහි ඇඳන් 28 ක් ද ඇත. වෛද්‍ය සායනය සඳුදා සිට සෙනසුරාදා දක්වා පවත්වනු ලැබේ. දියවැඩියාව,අධි රුධිර පීඩනය , ඇදුම සහ වෙනත් කායික රෝග වැලඳී ඇති රෝගීන් හට මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.සෙනසුරාදා දිනයේ අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරියක විසින් පවත්වනු ලබන අන්තරාසර්ග රෝග සායනයක් පැවැත්විනි.එය විශේෂිත දියවැඩියා සායනයක් ද වන අතර අඩු වයස් රෝගීන් (පලමු වර්ගයේ දියවැඩියා) , තයිරොයිඩ් ඌනතා සහ අනෙකුත් අන්තරාසර්ග රෝග සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.
2023.06.21 දින සිට ශ්වසන රෝග සම්බන්ධයෙන් නව සායනයක් ආරම්භ කිරීමද සිදු කරන ලදී.

2023 වසර තුල වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 45,777 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 (පිරිමි වාට්ටුව) හා 2 (ගැහැණු වාට්ටුව) ට සම්බන්ධ සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

වෙනත් විශේෂ සායනය

- **වෙනත් සායන (බෝ නොවන රෝග සායනය ,සුවනාරි සායනය ,පවුල් සංවිධාන සායනය)**

බෝ නොවන රෝග(NCD) සායනය , සුව නාරි හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේනිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි. මෙම සායන මගින් සැගවුනු රෝග පිලිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කරනු ලබන අතර දැනුවත් කිරීමේ වැඩසටහන් කාලානුරූපීව සංවිධානය කර ඇත.බෝ නොවන රෝග , සුවනාරි සහ පවුල් සංවිධාන සායන මගින් 2023 වසර තුලදී පිළිවෙලින් රෝගීන් 770 , 209 හා 24 දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත.
ගත වූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- ජංගම සායන Visiting clinic

අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු රෝහලේ නොමැති වුවද බාහිර විශේෂඥ වෛද්‍යවරියක විසින් අන්තරාසර්ග රෝග පිලිබඳ සායනයක් පවත්වනු ලබයි.
මීගමුව රෝහලේ මනෝවෛද්‍ය විශේෂඥවරයාගේ අධික්ෂණය යටතේ එහි මනෝචිකිත්සක ඒකකයේ පුහුණුව ලත් **ජ්‍යෝෂ්ය** වෛද්‍යවරයෙකු විසින් මනෝවෛද්‍ය සායනය පවත්වාගෙන යනු ලැබේ.
2023.06.21 දින සිට ශ්වසන රෝග සම්බන්ධයෙන් නව සායනයක් ආරම්භ කිරීමද සිදු කරන ලදී.
අන්තරාසර්ග සායනය සහ මනෝ වෛද්‍ය සායනය සහ ශ්වසන රෝග සායනය සතියකට වරක් ක්‍රියාතමක වන අතර අවට රෝහල් වලින් සහ සායන වලින් යොමු කරන රෝගීන්ට මෙහි ප්‍රතිකාර ලබා දෙනු ලබයි.
2023 වසර තුල අන්තරාසර්ග රෝග සායනය, මානසික රෝග සායනය සහ ශ්වසන රෝග සායනය සඳහා මුළු රෝගී සංඛ්‍යාව පිළිවෙලින් 8409 , 2299 , 129 විය.
ගත වූ වසර පහ තුල ජංගම සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

5. ශල්‍ය ඒකකය

ශල්‍ය ඒකකය 2016 මැද භාගයේ දී අලුතින් ස්ථාපිත කරන ලදී . එක් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් සහ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශල්‍ය ඒකකය සමන්විත වේ. වර්තමානයේ ඇඳන් 28 කින් යුතු වාට්ටුවක් මෙම ඒකකය සතු වේ.2016 අවසාන භාගයේදී ශල්‍ය ඒකකය වෙත නවීන එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම සිදු විය.

ශල්‍යාගාර සංකීර්ණයේ සාමාන්‍ය ශල්‍යකර්ම සඳහා වෙනම ශල්‍යාගාරයක් ඇති අතර එය සතියේ බොහෝ දින වල ශල්‍ය ඒකකය මගින් භාවිත කර ඇත.

2023 වසර තුල ශල්‍ය ඒකකය මගින් ලබා දුන් සේවාවන් පහත පරිදි වේ.

විස්තරය	මුලු සංඛ්‍යාව
සායනික රෝගීන් සංඛ්‍යාව	6,763
මුලු ශල්‍යකර්ම සංඛ්‍යාව	1,074
ප්‍රධාන ශල්‍යකර්ම සංඛ්‍යාව	524
සුලු ශල්‍යකර්ම සංඛ්‍යාව	254
ඩුප්ලෙක්ස් ස්කෑන් සංඛ්‍යාව	430
Sclerotherapy ක්‍රියා පටිපාටිය	229
පී ආර් පී එන්නත් ලබා දීම	230
එම් පී එන්නත් ලබා දීම	80
FNAC ක්‍රියා පටිපාටිය	-
මුලු එන්ඩොස්කොපි පරීක්ෂණ සංඛ්‍යාව	432
UGIE ක්‍රියා පටිපාටිය	52
LGIE ක්‍රියා පටිපාටිය	161
කොලනොස්කොපි සංඛ්‍යාව	47
Proctoscopy පටිපාටිය සහ Sclerotherapy එන්නත් සංඛ්‍යාව	48
බයොප්සි - UGIE සහ LGIE	47
Endovenous Radiofrequency Ablation (EVRFA)	294

<u>තුවාල සත්කාර සායනය හා වාට්ටුව</u>

විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයාගේ උපදේශනය යටතේ පාලනය වන මෙම අංශය ඇඳන් 21 කින් යුත් වාට්ටු එකකින් හා සායනයකින් සමන්විත විය.

දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මෙම සායනය සඳහා රෝගීන් පැමිණෙන අතර නිදන්ගත තුවාල සඳහා වාට්ටුගත ප්‍රතිකාර මෙන්ම සායනික ප්‍රතිකාරද ලබා දුනි.සෑම වසරකම තුවාල සත්කාර ඒකකයට සහ ශල්‍ය වෛද්‍ය ඒකකයට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කර ඇත.

2023 වසරේ තුවාල සත්කාර සායනය වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව 5679 ක් විය.

ගත වූ වසර පහ තුල මේ පිලිබඳ දත්ත 5 වන වගුව තුල දැක්වේ.

6. <u>අක්ෂි ඒකකය</u>

විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයන් දෙදෙනෙකු හා වෛද්‍ය නිලධාරීන් 5 දෙනෙක් මෙම අංශයට අනුයුක්ත කර ඇත .


මෙම ඒකකය ට අක්ෂි සායනය, ඇඳන් 40 කින් යුත් අක්ෂි වාට්ටුව හා අක්ෂි ශල්‍යාගාරය ඇතුළත් වන අතර මෙම ඒකකය මගින් පහත සේවාවන් ලබා දී ඇත.

- අක්ෂි සැත්කම්
- අක්ෂි සායන
- පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාවන්
- අක්ෂි පරීක්ෂණ
- ලේසර් ප්‍රතිකාර

අක්ෂි ඒකකය මගින් අවට ප්‍රදේශයේ රෝගීන්ට පමණක් නොව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර ලබාදේ.

- **<u>අක්ෂි සැත්කම්</u>**

ප්‍රධාන වශයෙන්ම ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදු කරනු ලබන අතර සිදු කරන ලද ශල්‍යකර්ම වර්ග පහත දැක්වේ.



2023 වසර තුල ප්‍රධාන අක්ෂි ශල්‍යකර්ම 9,258 ක් හා සුලු ශල්‍යකර්ම 669 ක් සිදු කර ඇත.ඒ අනුව මුලු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව 9,927 ක් වේ.

- **<u>අක්ෂි සායන</u>**

දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විවිධ අක්ෂි ආබාධ සහිත රෝගීන් මෙම සායන වලට පැමිණ ඇත. medical retina, surgical retina, uveitis, variety of corneal diseases, strabismus, ocular tumours , oculoplasty and neuro-ophthalmic cases වැනි ගැටලු සහිත රෝගීන්ට මෙහිදී ප්‍රතිකාර සැලසේ. සියලු අක්ෂි හදිසි අනතුරු සඳහා දිනපතා අක්ෂි සායනයේදී ප්‍රතිකාර සැලසේ.

සාමාන්‍ය අක්ෂි සායනයට අමතරව අක්ෂි දියවැඩියා සායනය ග්ලූකෝමා සායනය මෙන්ම අක්ෂි ළමා සායනයද පැවැත්වේ. ඒ සඳහා සහභාගී වන රෝගීන් සංඛ්‍යාව 294 සහ 180 කි.

2023 වසරේදී සාමාන්‍ය අක්ෂි සායන රෝගීන් 44,549 ක් සඳහා ප්‍රතිකාර සලසා ඇත. අක්ෂි සායනය සඳහා පැමිණි මුලු රෝගීන් සංඛ්‍යාව 45023 කි.

- **<u>පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාව</u>**

දෛනික සායනික වේලාවෙන් පසු අක්ෂි වාට්ටුව වෙත පැමිණි අක්ෂි අනතුරු සහ හදිසි රෝගීන් 2,038 ක් සඳහා 2023 වසරේදී ප්‍රතිකාර ලබා දී ඇත.

- **<u>අක්ෂි පරීක්ෂණ</u>**

මෙම ඒකකය විවිධ අක්ෂි පරීක්ෂණ පහසුකම් වලින් සමන්විත වේ.

I. දෘෂ්ඨී විතාන පරීක්ෂණ- Spectral domain OCT machine, B scanner, FFA
II. ග්ලූකෝමා පරීක්ෂණ-, OCT- RNFL
III. Biometry පරීක්ෂණ - A and B ultrasound scanner, IOL master

2023 වසරේදී OCT පරීක්ෂණ 2,721 ක් ද Biometry පරීක්ෂණ 9,484 ක් අක්ෂි අංශයේදී සිදු කර ඇත.

- **<u>ලේසර් ප්‍රතිකාර</u>**

ලේසර් පහසුකම භාවිතයෙන් දියවැඩියා රෙටිනෝපති කලමණාරකණය විශාල ප්‍රමාණයක් සිදු කරනු ලබන අතර දෘෂ්ඨී විතානයේ ශිරා අවහිරතා , දෘෂ්ඨී විතානයේ පර්යන්ත පරිහානිය ආදිය ඉවත් කර ඇත . PRP ලේසර් 486 ක්ද , FLT ලේසර් 59 ක්ද , YAG CAP ලේසර් 293 ක්ද , YAG PI ලේසර් 26 ක්ද , වෙනත් ලේසර් 02 ක්ද ඇතුලුව 2023 වසර තුල මුලු ලේසර් ප්‍රතිකාර 866 ක් සිදු කර ඇත.

<u>සහයක සේවා</u>

<u>7. වෛද්‍ය රසායනාගාරය</u>

වෛද්‍ය රසායනාගාරය නවීන පහසුකම් වලින් යුත් උපකරණ වලින් සමන්විත වන අතර ලේ සාම්පල් ලබා ගැනීම විධිමත් කිරීම සදහා වෙනම සාම්පල් කාමරයක් ස්ථාපිත කර ඇත. වෛද්‍ය රසායනාගාරය තුල වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් තිදෙනෙක් අනුයුක්තව ඇත. සදුදා සිට සෙනසුරාදා දක්වා ද , මසකට එක් ඉරිදාවක්ද රසායනාගාරය ක්‍රියාත්මක වේ.
2023 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 55,129 ක් විය.

<u>8. ඊ.සී.ජී.අංශය</u>

විද්‍යුත් බන්තු රේඛණ ශිල්පියෙකු විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට සේවාව සැපයේ. මෙම අංශය විවෘතව තබන කාලයෙන් පරිබාහිර කාලයේදී අත්‍යාවශ්‍ය රෝගීන්ගේ ඊ සී ජී ප්‍රාථමික සත්කාර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

2023 වසරේදී සිදු කල මුලු මුළු ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව 4,297 ක් විය.

<u>9. එක්ස් කිරණ අංශය</u>

එක් විකිරණ ශිල්පියකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විතව ඇත.නවීන CR යන්ත්‍රය ස්ථාපිත කිරීමත් සමග හානිකර රසායන ද්‍රව්‍ය වලට නිරාවරණය වීම අඩු විය .

2023 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව 1,518 ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යා ලේඛන 7 වන වගුව තුල දක්වා ඇත.

රෝගී සේවාවන් සම්බන්ධ සංඛ්‍යාලේඛණ සාරාංශය

අංක 1 වගුව

අංශය	ප්‍රතිකාර කරන ලද මුළු රොගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
බාහිර ප්‍රතිකාර ඒකකය	109,102	71,212	47,514	82,565	113,317
බාහිර ප්‍රතිකාර ඒකකය - එන්නත්		1,102	1,126	1,072	871
බාහිර ප්‍රතිකාර ඒකකය - සැරහුම්	-	8,703	6,395	5,312	2,824
ප්‍රාථමික සත්කාර ඒකකය	22,435	15,134	11,256	15,438	18,196
දන්ත සායනය	6,711	4,757	3,671	4,610	4,032

කායික වෛද්‍ය ඒකකය

අංක 2 වගුව

අංශය	සහභාගී වූ මුළු රොගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
වෛද්‍ය සායනය	42,436	34,012	30,212	36,160	45,777

අංශය	වාට්ටුගත රොගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
වෛද්‍ය වාට්ටු අංක 1 - පිරිමි	1,140	731	619	749	757
වෛද්‍ය වාට්ටු අංක 2 - ගැහැණු	1,555	1,046	851	1,009	1216

වෙනත් විශේෂ සායන

අංක 3 වගුව

අංශය	සායන සඳහා සහභාගී වූ මුළු රොගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
පවුල් වෛද්‍ය සායනය	5,336	6,929	5,275	6,013	-
බෝ නොවන වෛද්‍ය සායනය	523	279	426	555	770
සුවනාරි සායනය	58	15	439	687	209
පවුල් සැලසුම් සායනය			16	54	24

ජංගම සායන

අංක 4 වගුව

අංශය	සායන සඳහා සහභාගී වූ මුළු රොගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
දියවැඩියා සහ අධිරුධිර පීඩන සායනය	3,897	5,413	2,960	-	-
ළමා රෝග සායනය	532	182	-	-	-
මානසික රෝග සායනය	1,915	1,895	1,601	1,898	2299
උගුර කණ නාසය සායනය	339	135	-	-	-
අන්තරසර්ග රෝග සායනය			1,659	7,659	8409

ශල්‍ය අංශය

අංක 5 වගුව

අංශය	මුළු රෝගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
ශල්‍ය සායනය	4,427	3,261	4,829	6,545	6783
එන්ඩස්කොපි පරීක්ෂණ	1,085	748	566	430	432
සාමාන්‍ය ශල්‍යකරම	1,047	675	767	903	1062
වාට්ටු අංක 6 (ගැහැණු සහ පිරිමි)	3,512	2,544	2,284	2,496	2731
තුවාල සත්කාර ඒකකය	16,745	11,179	9,316	11,035	5679
වාට්ටු අංක 5 - තුවාල සත්කාර වාට්ටුව - ගැහැණු සහ පිරිමි	279	119	119	176	330

අක්ෂි අංශය

අංක 6 වගුව

අංශය	මුළු රෝගීන් සංඛ්‍යාව				
	2019	2020	2021	2022	2023
අක්ෂි සායනය	47,854	30,078	27,603	31,893	44549
අක්ෂි ශල්‍යකරම	2,849	3,724	5,521	5,823	9927
වාට්ටු අංක 3 - ගැහැණු සහ පිරිමි	3,747	4,410	5,679	5,941	10363
ලේසර් ප්‍රතිකාර	988	723	1,072	873	867
Refractive පරීක්ෂණ	2,197	5,602	5,549	9,638	9484

සහයක සේවා

අංක 7 වගුව

අංශය	Total No. of Patients				
	2019	2020	2021	2022	2023
රසායනාගාර පරීක්ෂණ	101,066	69,697	53,177	55,696	55129
එක්ස් රේ පරීක්ෂණ	3,791	1,929	1,816	1,963	1518
ඊසීජී පරීක්ෂණ	8,882	5,409	3,869	4,045	4297

2023 වසරේ සපුරාගත් ඉලක්ක

1) **<u>වෛද්‍ය උපකරණ මිලදී ගැනීම්</u>**

<u>ප්‍රධාන වෛද්‍ය උපකරණ-</u>	<u>රු.මිලියන</u>
1 Vitrectomy Machine	8.83
1 Mini Autoclave Machine	1.12
1 LED Light Source	2.97
1 Cardiac Moniter	0.05

2) **<u>ලී බඩු සහ සවිකිරීම් , යන්ත්‍රෝපකරණ සහ පරිගණක උපකරණ මිලදී ගැනීම්</u>**

	<u>රු.මිලියන</u>
පරිගණක උපාංග -ලැයිස්තුව අනුව	**0**.04
ලී බඩු උපකරණ (මේස , පුටු , කබඩ් යනාදිය)	0.06
යන්ත්‍රෝපකරණ	4.05

3) **<u>යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම</u>**

<u>ප්‍රධාන ගොඩනැගිලි කාර්යන්</u>

	<u>රු.මිලියන</u>
වාට්ටු අංක 05 හි තුවාල සත්කාර ඒකකය නවීකරණය කිරීම	**1.37**
ශල්‍යාගාරයෙහි වායු සමීකරණ ඒකකය වටා යකඩ වැටක් ඉදි කිරීම	**1.43**

2023 වසරේ ප්‍රධාන සිදුවීම්

1) රෝහලෙහි සේවය කරනු ලබන හෙද නිලධාරීන් දිරි ගැන්වීමේ වැඩසටහනක් 2023.01.30 දින පැවැත්වීම.

2) විජය කුමාරතුංග ශ්‍රීමතාණන් සිහි කිරීම සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන ලේ දන් දීමේ වැඩසටහන 2023.02.16 දින සිදු කිරීම.

3) තරුණ පරම්පරාව සඳහා දියවැඩියාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023.02.17 දියත් කිරීම.

4) ජාත්‍යන්තර හෙද දිනය 2023.05.12 දින සැමරීම.

5) 2023.07.17 දින නොරාටෙල් පෞද්ගලික සමාගම (Noratel pvt Ltd) මඟින් වාට්ටු අංක 02 අලුත්වැඩියා කර දීම.

6) 2023.10.09 දින රෝහල ආරම්භ කල දිනය සැමරීම.

7) 2023.11.20 දින දියවැඩියා දිනය සැමරීම.

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා

		2023	**2022 (**නැවත ප්‍රකාශ කරන ලදී**)**
ආදායම		රුපියල්	රුපියල්
රජයේ ප්‍රදානය (පුනරාවර්තන)		403,200,000.00	385,850,000.00
ක්‍රමක්ෂ ප්‍රාග්ධන ප්‍රදානය		22,483,420.64	25,250,545.97
පරිත්‍යාග ක්‍රමක්ෂ කිරීම		5,364,357.56	6,359,281.82
වෙනත් ආදායම්	15	110,788,767.60	53,646,202.37
මුළු ආදායම		541,836,545.80	471,106,030.16
වියදම්			
වේතන වැටුප් සහ සේවක ප්‍රතිලාභ	16	257,349,185.04	268,696,510.07
භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	19	179,641,776.80	108,960,895.97
ක්ෂය වීම	17	27,847,778.20	31,609,827.79
ක්ෂයවීම් නැවත තක්සේරු කළ වත්කම්		6,750,000.00	0.00
වෙනත් වියදම්	18	87,325,877.75	68,486,410.22
මුළු වියදම්		558,914,617.79	477,753,644.05
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය).		**(17,078,071.99)**	**(6,647,613.89)**

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් **31** දිනට

		2023	**2022 (**නැවත ප්‍රකාශ කරන ලදී**)**
වත්කම්		රුපියල්	රුපියල්
ජංගම වත්කම්			
මුදල් සහ මුදල්වලට සමාන දේවල්	1	6,619,238.71	21,174,657.92
ලැබිය යුතු දේ	2	16,734,217.50	16,597,488.45
ඉන්වෙන්ටරි	3	42,766,376.07	36,638,218.09
පෙරගෙවුම්	4	363,999.64	463,946.15
		66,483,831.92	74,874,310.61
ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය	5	31,643,712.74	31,643,712.74
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ (WDV)	6	89,963,366.26	85,068,928.69
ඉඩම් සහ ගොඩනැගිලි (WDV)	7	186,525,390.79	188,121,290.76
		276,488,757.05	273,190,219.45
මුළු වත්කම්		374,616,301.71	379,708,242.80
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු මුදල්	8	13,756,609.29	10,019,011.95
ණය හිමියන්	9	170,512,120.25	159,280,570.15
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	10	53,728,397.07	51,902,323.39
මුළු වගකීම්		237,997,126.61	221,201,905.49
ශුද්ධ වත්කම්		**136,619,175.10**	**158,506,337.31**

ශුද්ධ වත්කම් / කොටස්			
ප්‍රාග්ධනය	11	75,787,890.44	75,787,890.44
රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය	12	167,665,562.84	190,148,983.48
පරිත්‍යාග කිරීම	13	13,368,228.23	18,193,897.81
සංචිත - ප්‍රාග්ධන ලාභය		2,131,366.30	2,131,366.30
නැවත නක්සේරු කිරීමේ සංචිතය		22,500,000.00	-
සමුච්චිත අතිරික්තයන්/(හිඟයන්)	14	(144,833,872.71)	(127,755,800.72)
මුළු ශුද්ධ වත්කම් / කොටස්		**136,619,175.10**	**158,506,337.31**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

චන්ද්‍රිකා කුමාරතුංග

ගෞරවනීය

අධ්‍යක්ෂක මණ්ඩලය

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

දිනය : 2024/04/04

එන්.ඒ.උමගිලිය

අධ්‍යක්ෂක

අධ්‍යක්ෂක මණ්ඩලය

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

දිනය : 2024/04/04

DIRECTOR BOARD
WIJAYA KUMARATUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

CHAIRPERSON
WIJAYA KUMARATHUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

වෛද්‍ය ඩී.ජී.ඒ. රණවීර

අධ්‍යක්ෂ (භාවරණය)

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

දිනය : 27/02/24.

Director (Duty Cover up)
Wijaya Kumaratunga Memorial Hospital

පී.සී.ටී.පී.එන්. බර්නාඩ්

ගණකාධිකාරී

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

දිනය : 27/2/2024

Accountant
Wijaya Kumarathunga Memorial Hospital
Seeduwa

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය	
අතිරික්තය/(හිඟය)	(17,078,071.99)
<u>මුදල් නොවන ප්‍රවාහයන්</u>	
ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම).	34,597,778.20
ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම) (සමුච්චිත ක්ෂයවීම)	
ක්ෂය කිරීම	(27,847,778.20)
ගෙවිය යුතු මුදල් වැඩි වීම / (අඩු වීම).	3,737,597.34
ණය හිමියන්ගේ වැඩි වීම / (අඩු වීම).	11,231,550.10
භාණ්ඩ ලේඛනයේ වැඩි වීම / (අඩු වීම).	(6,128,157.98)
සේවක පිරිවැයට අදාළ ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම).	1,826,073.68
පෙරගෙවුම් වැඩි වීම / (අඩු වීම).	99,946.51
ලැබිය යුතු මුදල් වැඩි වීම / (අඩු වීම).	(136,729.05)
පැවරූ වත්කම්වල වටිනාකම අඩුවීමේ ප්‍රමාණය සහ මාරු කළ ස්ථාවර/වත්කම්වල ශුද්ධ වටිනාකම (වියදම් සඳහා අය කෙරේ)	17,835.90
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	320,044.51
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා එයි	
පිරියත සහ උපකරණ මිල දී ගැනීම	(14,875,463.72)
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු වැඩිවේ	-
ලැබුණු ප්‍රාග්ධන ආධාර	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(14,875,463.72)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	
මුදල් හා සමාන මුදල්වලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම).	(14,555,419.21)
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහමුදල්වලට සමාන දේ	21,174,657.92
කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දේ	6,619,238.71
<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන්</u>	
මුදල් සහ මුදල්වලට සමාන දේ	
බැංකු ගත ඇති මුදල්	6,527,058.71
අතෙති මුදල්	92,180.00
	6,619,238.71

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව

ශුද්ධ වත්කම් / කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

(සියල්ල ශ්‍රී ලංකා රුපියල් වලින්)

	රජයේ ප්‍රදාන ප්‍රාග්ධනය	වෙනත් ආයතනවලින් ලැබෙන පරිත්‍යාග	WKMH පදනම	BOI	UDA	සංචිත - ප්‍රාග්ධන ලාභය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	ශුද්ධ අතිරික්තය / (හිඟය)	මුළු
2023/01/01 දිනට ශේෂය	190,148,983.48	18,193,897.81	29,632,139.32	28,155,751.12	18,000,000.00	2,131,366.30	-	(127,755,800.72)	158,506,337.31
වසර තුළ PPE නැවත ඇගයීම්	-	-	-	-	-	-	22,500,000.00	-	22,500,000.00
වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානය	-	538,687.98	-	-	-	-	-	-	538,687.98
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම්	(22,483,420.64)	(5,364,357.56)	-	-	-	-	-	-	(27,847,778.20)
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය).	-	-	-	-	-	-	-	(17,078,071.99)	(17,078,071.99)
වර්ෂය තුළ ගැලපීම්		-	-	-	-	-	-	-	-
2023/12/31 දිනට ශේෂය	**167,665,562.84**	**13,368,228.23**	**29,632,139.32**	**28,155,751.12**	**18,000,000.00**	**2,131,366.30**	**22,500,000.00**	**(144,833,872.71)**	**136,619,175.10**

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව

2023 දෙසැම්බර් **31** දිනට ස්ථාවර වත්කම් කාලසටහන

(සියල්ල ශ්‍රී ලංකා රුපියල් වලින්)

(Rs)

අයිතම	01-01-2023 වන විට පිරිවැය	වසර තුළ එකතු කිරීම	වසර තුළ බැහැර කිරීම්	31-12-2023 වන විට	අගය	01.01.2023 වන විට	ක්ෂය වීම / එකතු කිරීම. අඩුරුදු	වසර තුළ බැහැර කිරීම්	31-12-2023 වන විට	31-12-2023 වන විට ලිහාහරින ලද අගය
ඉඩම්	27,159,873.50	-		27,159,873.50		-			-	27,159,873.50
ගොඩනැගිලි සහ උපාංග	217,726,660.08	2,802,965.87 2,802,965.87	-	220,529,625.95	2%	56,765,242.82	4,398,865.84		61,164,108.66	159,365,517.29
වාහන	26,808,792.90	4,200,707.10	9,500.00	31,000,000.00	20%	24,898,787.90	8,660,003.00	18,308,791.90	15,249,999.00	15,750,001.00
ගෘහභාණ්ඩ උපාංග සහ උපකරණය	18,961,417.69	581,702.50 581,702.50	1,603,231.05	17,939,889.14	10%	11,488,172.47	915,308.29 -	1,585,949.05	10,817,531.71	7,122,357.43
යන්ත්‍රෝපකරණ	29,099,231.70	4,051,805.33 4,051,805.33	1,478,720.40	31,672,316.63	15%	19,496,4[illegible].81	3,669,317.72 -	1,478,173.50	21,687,551.03	9,984,765.60
පරිගණක	7,862,294.90	432,500.00 432,500.00	105,152.00	8,189,642.90	20%	4,443,240.00	1,138,596.63 -	105,146.00	5,476,690.63	2,712,952.27
වෛද්‍ය උපකරණ	301,421,551.14	7,545,178.00 7,545,178.00	-	308,966,729.14	15%	238,757,752.46	15,815,686.72		254,573,439.18	54,393,289.96
ධාරිතාව ගොඩනැගිල්ල	-			-	10%					
මුළු	629,039,821.91	19,614,858.80	3,196,603.45	645,458,077.26		355,849,602.46	34,597,778.20	21,478,060.45	368,969,320.21	276,488,757.05

පරිත්‍යාග කිරීම	538,687.98
නැවත ඇගයීම්	4,200,707.10
පැවැ PPE එකතු කිරීම	14,875,463.72

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව

(සියල්ල ශ්‍රී ලංකා රුපියල් වලින්)

ගිණුම් වෙත සටහන්

		2023	2022 (නැවත සකස් කර ඇත)
<u>මුදල් සහ මුදල්වලට සමාන දේ</u>	1		
බැංකු ගත මුදල්		6,527,058.71	20,676,677.92
සුළු මුදල්		-	-
අතෙති මුදල්		92,180.00	497,980.00
		6,619,238.71	21,174,657.92
<u>ලැබිය යුතු දේ</u>	2		
තැන්පතු ගිණුම		395,429.10	635,429.10
උත්සව අත්තිකාරම්		303,750.00	275,000.00
විශේෂ අත්තිකාරම්		-	400.00
ලැබිය යුතු - ආපනශාලා සහ කිරි කඩය		98,600.00	101,600.00
නැවත ලබා ගත හැකි - අතුරු සහ භාෂා දීමනාව			160,196.32
අයකරගත හැකි - රන්ජන් බිල්ඩර්ස්			7,956.39
කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් අයකරගත හැකි (බැඳුම්කර ආදිය)		2,185,557.00	-
ලැබිය යුතු Covid මධ්‍යස්ථානය		2,249,167.05	2,249,167.05
ආපදා ණය		11,501,714.35	13,167,739.59
		16,734,217.50	16,597,488.45
<u>ඉන්වෙන්ටරි</u>	3		
ස්ථාවර		641,208.47	886,738.82
ඖෂධ		39,023,785.91	29,989,710.18
රසායනාගාර රසායන		2,203,432.43	4,329,026.46
ලිනන් භාණ්ඩ		124,878.54	240,793.54
පොදු වෙළඳසැල්		514,359.59	922,817.47
අලුත්වැඩියාව සහ නඩත්තුව		111,678.50	173,495.50
එක්ස් කිරණ		102,720.64	60,150.13
දන්ත වෛද්‍ය		44,311.99	35,485.99

		42,766,376.07	36,638,218.09
<u>පෙරගෙවුම්</u>	4		
වෛද්‍ය උපකරණ සේවා ගිවිසුම		123,931.77	89,529.46
ෆැක්ස් සමඟ සේවා ගිවිසුම		8,510.01	
Duplicating Mc සමඟ සේවා ගිවිසුම			15,611.22
බලපත්‍රය / රක්ෂණ අලුත් කිරීම		147,420.36	100,855.39
QB පද්ධති නඩත්තු / වැටුප් ගෙවීම		27,500.00	27,500.00
සෝපානයේ සේවා ගිවිසුම			223,732.22
ජනක සේවා		56,637.50	6,717.86
		363,999.64	463,946.15
<u>ප්‍රග්ධන වැඩ ප්‍රගතිය</u>	5		
වැඩ වැඩ සටහන් - නව ගොඩනැගිලි කාර්යාලය		662,076.27	662,076.27
වැඩ සටහන් - නව ගොඩනැගිල්ල 2		30,981,636.47	30,981,636.47
		31,643,712.74	31,643,712.74
<u>යටිතල පහසුකම්, කර්මාන්තශාලා සහ උපකරණ</u>	6		
යන්ත්‍රෝපකරණ		9,984,765.60	9,602,824.89
ගෘහභාණ්ඩ		7,122,357.43	7,473,245.22
වාහන		15,750,001.00	1,910,005.00
පරිගණක		2,712,952.27	3,419,054.90
වෛද්‍ය උපකරණ		54,393,289.96	62,663,798.68
		89,963,366.26	85,068,928.69
<u>ඉඩම් සහ ගොඩනැගිලි</u>	7		
ඉඩම්		27,159,873.50	27,159,873.50
ගොඩනැගිලි සහ උපාංග		159,365,517.29	160,961,417.26
		186,525,390.79	188,121,290.76

<u>උපචිත වියදම්</u>	**8**		
ගෙවිය යුතු විගණන ගාස්තු		950,000.00	815,580.00
ගෙවිය යුතු විදුලි බිල්පත්		2,196,294.54	682,166.50
ගෙවිය යුතු දුරකථන ගාස්තු		27,382.35	28,865.58
ගෙවිය යුතු ඉන්ධන		51,716.00	326,280.00
ගෙවිය යුතු යැපුම්		5,450.00	12,650.00
ගෙවිය යුතු නීතිඥ ගාස්තු		80,000.00	-
රසායනාගාර රසායන සඳහා ගෙවිය යුතුය	**1,780,390.52**		
ගෙවිය යුතු බිල්පත් සහ නඩත්තුව - වෛද්‍ය උපකරණ		**80,442.28**	**438,331.13**
ගෙවිය යුතු ජල බිල්පත්	**6,700.00**		
මණ්ඩල ලේකම් සඳහා ගෙවිය යුතු දීමනාව	**35,000.00**	**35,000.00**	
ගෙවිය යුතු අපද්‍රව්‍ය කළමනාකරණ බිල්පත්	**247,990.24**	**128,869.00**	
ගෙවිය යුතු බිල්පත් සහ නඩත්තු කිරීම - ගොඩනැගිල්ල		**61,453.51**	
	5,516,119.44	**2,474,442.21**	

ගෙවිය යුතු මුදල්			
ආපසු ගෙවිය හැකි ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		**191,900.00**	**336,940.00**
ගෙවිය යුතු රඳවා තබා ගැනීමේ මුදල්	**402,520.35**	**360,332.11**	
ගෙවිය යුතු පාරිතෝෂිකය	**1,276,659.38**		
ගෙවිය යුතු මුද්දර ගාස්තු	**50.00**	**100.00**	
සුබසාධක සංගමයට / කතෝලික සමාජයට ගෙවිය යුතු මුදල		**700.00**	
දීමනා සහ අනෙකුත් වැටුප් සම්බන්ධ ගෙවීම්		**293.54**	**485,482.75**
කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප	**583,708.25**	**664,425.57**	
බාහිර වෛද්‍යවරුන් සඳහා ගෙවිය යුතු දීමනාව		**418,615.41**	**202,358.27**
NO වෙත ගෙවිය යුතු අවදානම් දීමනාව		**700.00**	
පුහුණුවන්නන් සඳහා ගෙවිය යුතු දීමනාව	**41,600.00**	**45,300.00**	
වෛද්‍ය ජයන් මහතාට ගෙවිය යුතු (උසස්වීම)		**703,800.00**	
ගෙවිය යුතු **EPF ETF**	**25,464.67**		
ගෙවිය යුතු අතිකාල, අමතර තීරුබදු සහ **PH** ගෙවීම්		**5,298,978.25**	**4,745,131.04**
	8,240,489.85	**7,544,569.74**	
	13,756,609.29	**10,019,011.95**	

ණය හිමියන්	**9**		
SPC		-	2,913,683.60
MSD		131,669,487.89	120,160,383.29
නලින් තුෂාර / පනාගොඩ		200,000.00	191,106.00
තරු පිරිසිදු කරන්නන්	-	**72,531.00**	
සුදීන සැපයුම්කරුවන්	**2,937,840.65**	**1,417,524.95**	
කාර්මික ගෑස්	**9,221.01**	**31,370.28**	
Swastha Environmental		**3,506,566.82**	**-**
Super Will Shilne	-	**2,528,250.01**	
ලංකා ධීවර සංස්ථාව	**492,135.30**	**146,568.30**	
LRDC ආරක්ෂක සේවය		**715,232.11**	**837,516.25**
CECB	**30,981,636.47**	**30,981,636.47**	
	170,512,120.25	**159,280,570.15**	

සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

පොදු

සැකසීමේ පදනම

1.1.1 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

1.1.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකසා ඇත.

1.1.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකසා ඇත.

රාජ්‍ය ප්‍රදාන

1.2 මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන වර්ග දෙකකින් ලැබේ. ඒවා නම්
ප්‍රාග්ධන ප්‍රදාන
පුනරාවර්තන ප්‍රදාන

1.2.1 ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව ගණනය කෙරේ. ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්වල භාවිත ආයුකාලය පදනම් කරගත් ආදායමක් ලෙස හඳුනාගන්නා විලම්බිත ආදායම් (වාර්ෂිකව ක්ෂයවන වත්කම් වටිනාකම වසරේ ආදායමක් ලෙස ගණන් ගැනේ) ක්‍රමය තුල පිළිගැනේ.

1.2.2 පුනරාවර්තන ප්‍රධාන අදාල කාලය තුල ආදායමක් ලෙස හඳුනා ගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

1.3 **බදු අයකිරීම්**

අදාළ වසර තුල ඌනතාවයක් ලබා ඇති හෙයින් මණ්ඩලය බදු සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

මණ්ඩලය නිරතුරව ගිණුම් ප්‍රතිපත්ති අනුව පූර්ව වසර වල අගයන් සලකමින් කටයුතු කර ඇත.

2. **වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම**

2.1 **දේපල, පිරියත හා උපකරණ අගය ක්ෂයවීම් හා ප්‍රතිඇගයුම**

2.1.1 දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකර ඇගයුමට දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු ඒවා ඉදිකිරීම් මිලදී ගැනීමේ පිරිවැය සමඟ වත්කම් අපේක්ෂිත භාවිතාව සඳහා පත් කිරීමට අදාළව කළ අතුරු වියදම් ඇතුළත් වේ.

සේවා ලබා දීමට හැකි වන පරිදි හෝ සේවා ධාරිතාවය වැඩිකරලීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදු කළ ස්ථාවර තත්වයේ යුතු වත්කම් වැඩිදියුණු කිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා කළ වියදම් **මූලධන වියදම් වශයෙන් සලකනු ලැබේ.**

2.1.2 සින්නක්කර ඉඩම් හැර වත්කම් පහත දැක්වෙන අනුපාතයට සෘජු රේඛීය ක්‍රමය භාවිතා කර **පහත සඳහන් ප්‍රමාණයන්ට ක්ෂය වීම් ගණන් බලා ඇත.**

ගොඩනැගිලි හා සවිකිරීම්	2%
වාහන	20%
ලීබඩු, සවිකිරීම් හා උපකරණ	10%
යන්ත්‍රෝපකරණ	15%
වෛද්‍ය උපකරණ	15%
පරිසණක	20%

2.1.3 මිලදී ගත් වසරට හා මිලදී ගැනීමට අදාලව **ක්ෂය** දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසරේ කිසිදු ක්ෂය දැක්වීමක් කර නොමැත.

2.1.4 මූල්‍ය ගලන ප්‍රකාශය තුල මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් හා බැංකුගත මුදල් ඇතුළත් වේ.

3. බැරකම් හා ප්‍රතිපාදන

3.1 ප්‍රාග්ධන බැදීම් හා අවිනිශ්චිත බැරකම්

ශේෂපත්‍ර දිනට වූ සියළු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන **බැඳීම්** වියදම් වෙන්කිරීම් හා **අවිනිශ්චිත** බැරකම් ගිණුම් සටහන් වල දක්වා ඇත.

3.2 වටිටෝරු භාණ්ඩ / තොග ඇගයුම

තොග පිරිවැයට ඇගයුම් කර ඇත.

4. ආදායම් හා වියදම්

4.1 ආදායම්

4.1.1 මණ්ඩලයේ ආදායම් තුල පුද්ගලික වෛද්‍ය සහතික හා රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සහ විවිධ ආදායම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

4.1.2 සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 වියදම

රෝගී ප්‍රතිකාර ලබා දීමට හා ප්‍රාග්ධන වත්කම් සක්‍රිය ලෙස නඩත්තු කරලීමට අදාල සියළු වියදම් වසරේ අතිරික්තය හෝ හිඟය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායමට බැර කර ඇත.

ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යසාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ව පැහැදිලි වන ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } විඋවකා/ඒ/ඩබ්කේඑම්එච්
/එෆ්ජී/2022/02

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 ජූනි30දින

සභාපති,
විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 22 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් සඳහා දරන ලද වියදමින් වත්කමෙහි අගය වැඩිවීමක් සිදුවේ නම් එය වත්කමෙහි අගයට එකතු කළ යුතු වුවත් Vitre Ctomy යන්ත්‍රය සඳහා යොදන ලද නව මොඩියුලය සහ ඖෂධාලය. තුවාල සත්කාර ඒකකය එන්ඩොස්කොපි ඒකකය, සැරහුම් කාමරයන්හි විදුලි පද්ධතිය අළුත්වැඩියාව සඳහා වැය කරන ලද රු.8,833,700 ක් හා රු.2,605,631ක් ප්‍රාග්ධන ගත නොකර වියදමක් ලෙස වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර නිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් (ගොඩනැගිලි හා සවිකිරීම් සහ වෛද්‍ය උපකරණ) එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා නිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.203,269,478 ක්වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනයකර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 7 හි 69 ඡේදය පරිදි වත්කම් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස වත්කම භාවිතයට ගත් දිනය නොසලකා මුළු වර්ෂයටම ක්ෂය කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකසා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 100 ඡේදය පරිදි අනාගතයේදී ඇති විය හැකි බැඳීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළයුතු වුවත් රෝහලට විරුද්ධව පවරා තිබූ නඩු 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඉ) විජය කුමාරතුංග අනුස්මරණ රෝහල වෙත 2022 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.9,500,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුට අදාල ගෙවිය යුතු පාරිතෝෂික මුදල රු.407,857 ක් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) විදේශගතවූ වෛද්‍ය නිලධාරිනියකගේ වැටුප් රහිත නිවාඩු අවසන්ව නිබියදී සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2019 මාර්තු 08 දින සිට සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර තිබුණි. මෙම නිලධාරිනියගෙන් අයවිය යුතු රු.652,627 ක බැඳුම්කර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර මෙම වාර්තාවේ දින වනවිටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සත්තිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවශ්‍යතාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධානවලට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756	සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.55,155,153 ක වටිනාකමක් ඇති වෛද්‍ය උපකරණ 2021 හා 2022 වර්ෂයන්හි සමීක්ෂණය කර නොතිබුණි.
(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) ඡේදය	නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමෙන් දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවද සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගේ පාරිතෝෂික මුදල් ගෙවීමට 2023 මැයි 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය	අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 2009/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ චාර්තා තබා ගත යුතු වුවද, රෝහලේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි .

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ආරෝග්‍යශාලා මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ඖෂධ ගබඩාව පැරණි පවුල් වෛද්‍ය සායනය වෙත ගෙන යාම වෙනුවෙන් වූ රු.1,116,250 ක අළුත්වැඩියා වියදම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශ ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකසා නොතිබූ අතර 2.14 මාර්ගෝපදේශය ප්‍රකාරව ඒ ඒ මූල්‍ය සීමාවට අදාළ අධිකාරී අනුමැතිය ලබා නොගෙන, පිරිවිතර හා මිනුම් හඳුනා ගැනීමකින් තොරව හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මෙම කාර්යය රු.100,000 ට අඩු වටිනාකම් යටතේ වැඩපත් කොටස් කර එක් සැපයුම්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ලබා දීමට රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කර තිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.5 (ආ) ඡේදය පරිදි, තත්කාර්යය සඳහා පත්කරන ලද ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව සඳහා විෂය පිළිබඳ දැනුම් ඇති විශේෂඥයකුගෙන් සහ අදාල ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකුගෙන් සමන්විත වන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සැහීමකට පත්වන්නේනම් හැර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කල යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමකින් තොරව ප්‍රාථමික සත්කාර ඒකකයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව හා පොදු ගබඩාව ඉදිරිපිට භූමිය සැකසීම සඳහා වූ රු.3,395,012 ක අළුත්වැඩියා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

(ඇ) ප්‍රාථමික සත්කාර ඒකකයේ විදුලි පද්ධතිය අලුත්වැඩියාවට අදාල තාක්ෂණික නිලධාරීගේ (විදුලි) 2022 මාර්තු 23 දිනැති ඇස්තමේන්තුවේ වටිනාකම රු.1,791,595 (වැට් රහිත) වුවත් අවසන් බිල්පත්හි වටිනාකම රු.2,605,631 ක් විය. මෙම වෙනස්වීමට ප්‍රමාණවත් සාධාරණීකරනයක් ඉදිරිපත් වී නොතිබූ අතර තාක්ෂණික වාර්තාව සම්බන්ධව අමාත්‍යාංශ විදුලි ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයක් ලබා ගැනීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 වගන්තිය අනුව උද්ධමනය හෝ වෙනත් කරුණු සැලකිල්ලට ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කර අදාල අධිකාරිය විසින් අනුමත කිරීමෙන් පසු මිල ගණන් කැඳවීමට කටයුතු කර නොතිබුණි.

එසේම අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රෝහල් අධ්‍යක්ෂවරයාගේ අත්සනින් යුත් 2022 මැයි 12 දිනැති ලිපියක් සමඟ ලංසු ලේඛන යවා මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2013 මැයි 01 දින ගණකාධිකාරී ලෙස පත්වීම් ලද නිලධාරිනියකගේ සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කිරීම සම්බන්ධයෙන් රෝහලට එරෙහිව මීගමුව කම්කරු විනිශ්චය සභාවේ 2019 ජූලි 30 දින පවරන ලද අංක 21/32/2019 දරන නඩුව සම්බන්ධයෙන් ඇති වූ එකඟතාව අනුව එම නිලධාරිනිය දැනට වෙනත් රැකියාවක නිරත වන බැවින් ඉල්ලා අස්වීමක් ලෙස පිළිගෙන ඉල්ලා අස්වීම ලබාදීමටත් රු.500,000 ක වන්දි මුදලක් ගෙවීමටත් රෝහලට සිදුව තිබුණි. ඒ අනුව රෝහලට වන්දි මුදල් හා නීතිඥ ගාස්තු ලෙස එකතුව රු.690,000 ක නිශ්කාර්ය වියදමක් දැරීමට සිදුව තිබුණි.

(ආ) රෝහලේ නඩත්තු අංශයේ සේවය කල නඩත්තු කම්කරු දෙදෙනෙකු හා එක් විදුලි කාර්මිකයෙකු 2021 වර්ෂයේදී එම අංශයෙන් වෙනත් ස්ථාන වෙත මාරුකර තිබීම හේතුවෙන් රෝහලේ නිත්‍ය ආලේප කිරීම හා අනෙකුත් සුළු නඩත්තු වැඩ බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදීමට සිදුවී තිබුණි. ඒ අනුව රෝහලේ මානව සම්පත් ඵලදායීව භාවිතා කර අවම පිරිවැයකින් කළ හැකිව තිබුණු කාර්යයන් බාහිර පාර්ශවයන්ට ලබාදීමෙන් රෝහලට මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණු බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.ඩී.වික්‍රමරත්න

විගණකාධිපති